# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2015

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
විද්‍යා මාවත
කොළඹ 07.

# පෙරවදන

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2015 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛණ අංක 402 මඟින් ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව සකස් කොට ඇත.

මෙම වාර්තාවේ I කොටස මඟින් අමාත්‍යාංශයේ පොදු තොරතුරු සමඟ සමස්ත මූල්‍ය ප්‍රගතිය ද අමාත්‍යාංශයේ අනෙකුත් අංශයන් විසින් 2015 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා සිදුකරන ලද කාර්යයන් පිළිබඳව ද තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, මෙම වාර්තාවේ II කොටසින් ඉදිරිපත් කරනු ලබන්නේ අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ පවතින ආයතනයක් වන ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානයේ 2015 වර්ෂය තුළ සිදුකරන ලද කාර්යයන්හි කාර්යසාධනයයි.

# හැඳින්වීම

ආපදා කළමනාකරණ විෂය වඩාත් වැදගත් වීමට හේතුවූ ප්‍රධාන සාධකය වූයේ ශ්‍රී ලාංකීය ජනතාවට මින් පෙර අත්දකින්නට නොලැබුණු ආකාරයේ සිදුවීමක් වූ වර්ෂ 2004 දෙසැම්බර් මස 26 වන දින බලපෑ සුනාමි ව්‍යසනයෙන් තිස්පන්දහසකට (35000) අධික ජීවිත සංඛ්‍යාවක් අහිමි වීමය. එම ව්‍යසනයෙන් ලක්ෂ 5කට අධික ජනතාව අභ්‍යන්තර අවතැන් වූවන් බවට පත්විය.

මෙම ජීවිත හානි, ආර්ථික පසුබෑම සහ ඉන් සමාජයට වූ බලපෑම සම්බන්ධයෙන් සුභසාධන කටයුත්තක් සේ පැවති ආපදා කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් හා නීතිමය ව්‍යුහයක අවශ්‍යතාවය ඉස්මතු විය. ඒ අනුව මෙවැනි ව්‍යසනයන්ට සාර්ථකව මුහුණදීමට අවශ්‍ය ආයතනික හා නීතිමය ව්‍යුහය නිර්ණය කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ස්ථාපිත කරන ලදි. එම තේරීම් කාරක සභාවේ නිර්දේශයන්ට අනුව 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලදි.

ඒ අනුව 2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනතින් ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් ස්ථාපිත කරන ලදි. එම ආයතන තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා වර්ෂ 2006 ක් වූ පෙබරවාරි මස 20 වෙනි දින නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ආපදා කළමනාකරණ හා මානව හිමිකම් පිළිබඳ කැබිනට් අමාත්‍යාංශය ස්ථාපිත කරන ලද අතර, 2010 අප්‍රේල් මස 30 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ලෙස නම්කොට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය අමාත්‍යාංශය යටතට ගෙනෙන ලදි.

ආපදා කළමනාකරණයේ දී අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය , කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යන ආයතන මගින් අමාත්‍යාංශය වෙත පැවරි ඇති කාර්යයන් සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා ආපදාවක්වීමට පෙර ආපදා අවස්ථාවේ දී සහ ආපදාවලින් පසුව ද මහත් සේවයක් ඉටුකරනු ලැබේ. මේ නිසා ආපදාවලින් ජන ජීවිත දේපල සහ සේවා සුරක්ෂිත වීමත්, ප්‍රත්‍යස්ථ සමාජයක් උදෙසා ප්‍රජා සුරක්ෂිතභාවය තහවුරු කිරීමත්, පශ්චාත් ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහාත් පහසුකම් සැපයීම සිදුකරනු ලබයි.

අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය සහ මාර්ගෝපදේශකත්වය යටතේ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් පහත සඳහන් කාර්යයන් පසුගිය වසර පුරා ක්‍රියාත්මක කරන ලදි.

- ✓ විපතට පත් ජනතාව සඳහා අවශ්‍ය සහන සැලසීම
- ✓ ආපදා වලින් පිඩාවට පත්වන ජනතාව වෙනුවෙන් ව්‍යාපෘති හඳුනා ගැනිම, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම (ආපදා ප්‍රත්‍යස්ථ නිවාස ඉදි කිරීම ආදිය)
- ✓ ස්වාභාවික මෙන්ම මිනිසා විසින් නිර්මිත ආපදාවලින් පීඩාවට පත් ජනතාවගේ ජීවනෝපායන් සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් කරනු පිණිස පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ✓ නියඟයෙන් වන පීඩා අවම කිරීම සඳහා ජල සැපයුම් හා නියං සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ✓ ආපදා තත්ත්වයන් පිළිබඳ දත්ත රැස් කිරීම සහ තොරතුරු ප්‍රචාරය කිරීම.
- ✓ ආපදා වාතාවරණයන්ට මුහුණ දෙන ආකාරය සහ සහන යාන්ත්‍රණ පිළිබඳව රාජ්‍ය නිලධාරීන් සහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.
- ✓ හදිසි ආපදා තත්ත්වයකදී සහන මෙහෙයුම සම්බන්ධීකරණය කිරීම
- ✓ කාර්ය-සම්පාදන සේවාවන් සැපයීම

## දැක්ම

"සුරක්ෂිත ශ්‍රී ලංකාවක්"

## මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන්නා වූ ආපදා වලින් ඇතිවන්නා වූ අහිතකර බලපෑම් ඵලදායි ලෙස වැළැක්වීම සහ අවම කිරීම තුලින් සමෘද්ධිමත් සහ අභිමානවත් ජන ජීවිතයක් සඳහා පහසුකම් සැපයීම.

## අරමුණු

- **ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම**
- **පූර්ව අනතුරු ඇඟවීමේ සහ ප්‍රචාරණය කිරීමේ යාන්ත්‍රනය ක්‍රියාත්මක කිරීම**
- **සියළු ස්ථර සඳහා ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම**
- **සංවර්ධන සැලසුම් සඳහා ආපදා අවදානම අවම කිරීමේ ක්‍රියාදාමයන් අනුගත කිරීම**
- **සංවර්ධන සැලසුම් ක්‍රියාවලිය සඳහා බලපෑම් තක්සේරුකරණය අනුගත කිරීම**
- **ආපදා අවදානම අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් එම ප්‍රදේශ ආපදාවන්ට ලක්වීම අවම කිරීම**
- **නායයෑම් අවදානම් තක්සේරුකරණය සහ සහතික නිකුත් කිරීම**
- **ආපදා වලින් විපතට පත් වූවන් සඳහා සහන සැපයීම**
- **ආපදා මූලික පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්**
- **පශ්චාත් ආපදා පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණය**

## කාර්යයන්

මෙම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා 2010 නොවැම්බර් 22 නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශය වෙත පහත සඳහන් කාර්යයන් පවරා ඇත.

- ස්වාභාවික විපත් හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන විපත්වල දී සහන සැලසීමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා කළමනාකරණය.
- ව්‍යසන අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම හා යථාත්වීකරණය පිළිබඳ ප්‍රතිපත්ති, වැඩ සටහන් හා ව්‍යාපෘති සම්පාදනය
- අදාල අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමග එකගතාවයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමානය තුළ ඉහත ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
- ජාතික ප්‍රතිපත්තිය මත පදනම් වූ ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම හා හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම
- ව්‍යසන අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම සහ යථාත්වීකරණය පිළිබඳ විදේශීය ආධාර ව්‍යාපෘති ආරම්භ කිරීම හා සම්බන්ධීකරණය
- ඉහත කාර්යයන් නිසි වේලාවට ක්‍රියාත්මක වීම සහතික කර ගැනීම පිණිස අමාත්‍යාංශ හා රාජ්‍ය සංවිධාන සමග සම්බන්ධීකරණය
- ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසන පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම
- ගංවතුර , නියගය , නායයෑම්, වසංගත රෝග සහ වෙනත් විශේෂ හේතූන් නිසා සිදුවන ආපදාවන්හි දී සහන සැලසීම
- ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන ව්‍යසන වලදී ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම
- පෙර අනතුරු ඇඟවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- නිවාස හා ගොඩනැගිලි ඉදි කිරීම් තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු
- කාලගුණ විද්‍යාත්මක සමීක්ෂණ හා පර්යේෂණ කටයුතු
- අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවතින ආයතනවල අනෙකුත් සියළුම විෂයයන් හා අධීක්ෂණ කටයුතු

# පටුන

I කොටස


01 පාලන කටයුතු 01-06

02 සැලසුම් හා සංවර්ධන කටයුතු 07 - 10

03 ගිණුම් කටයුතු /ප්‍රසම්පාදන කටයුතු 11 -12

04 අභ්‍යන්තර විගණන කටයුතු 13


II කොටස


ජාතික ආපදා සහනසේවා කටයුතු 14 - 35

## 01 . පාලන කටයුතු

✓ කාර්ය මණ්ඩලය

| අංකය | තනතුරු නාමය | අනුමත කාර්යය මණ්ඩලය | තත්‍ය සේවක මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | ලේකම් | 01 | 01 | - |
| 2. | අතිරේක ලේකම් (පාලන හා මුදල්) | 01 | 01 | - |
| 3. | අතිරේක ලේකම් (සංවර්ධන හා සහන සේවා) | 01 | 01 | - |
| 4. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 | 01 | - |
| 5. | ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - |
| 6. | අධ්‍යක්ෂ (කළමනාකරණ) | 01 | 01 | - |
| 7. | අධ්‍යක්ෂ ( ආපදා සහන සේවා) | 01 | 01 | - |
| 8. | අධ්‍යක්ෂ (සැලසුම්) | 01 | 01 | - |
| 9. | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | 01 | 01 | - |
| 10. | සහකාර ලේකම් | 02 | 02 | - |
| 11. | නියෝජ්‍ය අධ්‍යක්ෂ(සහන සේවා) | 03 | 02 | 01 |
| 12. | සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ) | 01 | 01 | - |
| 13. | ගණකාධිකාරී | 01 | 01 | - |
| 14. | ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) | 01 | - | 01 |
| 15. | නීති නිලධාරි | 01 | 01 | - |
| 16. | පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| 17. | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්(තාවකාලික) | 01 | 01 | - |
| 18. | භාෂා පරිවර්තක | 02 | - | 02 |
| 19. | සංවර්ධන නිලධාරි | 01 | 01 | - |
| 20. | සංවර්ධන සහකාර | 08 | 08 | - |
| 21. | සංවර්ධන නිලධාරි (111 ශ්‍රේණිය) | 30 | 23 | 07 |
| 22. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 20 | 17 | 03 |
| 23. | කාර්මික නිලධාරි (තාවකාලික) | 01 | - | 01 |
| 24. | කැමරා ක්‍රියාකරු (තාවකාලික) | 01 | - | 01 |
| 25. | නිශ්චල ඡයාරූප ශිල්පි | 01 | - | 01 |
| 26. | කැමරා ක්‍රියාකරු (සහායක) | 01 | 01 | - |
| 27. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 01 | 01 | - |
| 28. | තාක්ෂණික නිලධාරි | 01 | 01 | - |
| 29. | රියදුරු | 15 | 11 | 04 |
| 30. | කාර්යාල කාර්ය සහායක | 15 | 11 | 04 |
| | එකතුව | 117 | 92 | 25 |

✓ **ස්ථාන මාරුවීම් / විශ්‍රාම ගැන්වීම්**

2015 වර්ෂයේ ජනවාරි මස සිට එම වර්ෂයේ දෙසැම්බර් මස දක්වා අමාත්‍යාංශයේ සේවක මහත්ම මහත්මීන් හත්දෙනෙකු වෙනත් සේවා ස්ථාන සඳහා මාරුවීම් ලැබ ඇති අතර, අමාත්‍යාංශය වෙත ස්ථානමාරු ලැබ පැමිණි සේවක මහත්ම මහත්මීන් ගණන දොළොස් දෙනෙකි . අමාත්‍යාංශය වෙත තාක්ෂණික නිලධාරි තනතුර සඳහා නව නිලධාරි මහතෙකු බඳවා ගන්නා ලදි.

මීට අමතරව 2015 වර්ෂය තුලදී කාර්යාල කාර්ය සහායක සේවය සඳහා සේවක මහතුන් හතරෙදෙනකු නව පත්වීම් ලබා අති අතර, ස්ථානමාරු ලැබ පැමිණි ගණන තුනකි. ස්ථානමාරු ලැබ පිටව ගිය ගණන පහකි. රියදුරු සේවයේ නව පත්වීම් ගණන හතරක් වන අතර, ස්ථානමාරු ලබා පැමිණි ගණන තුනක් හා ස්ථානමාරු ලබා පිටවීම් ගණන පහකි.

✓ **ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම**

මෙම පනත 2005 වර්ෂයේ සිට බලාත්මක වී ඇති අතර, ප්‍රයෝගිකව පනත ක්‍රියාත්මක වීමේ දී ඇති වූ ගැටළු අවම කර ගැනීම සඳහා කරන ලද සංශෝධන ඇතුලත් සංශෝධිත පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කරන ලද අතර, නීතිපතිතුමා ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා මේ වන විට කෙටුම්පත යොමු කර ඇත. නැවත 2015 වසර තුළ දී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලියක් ආරම්භ වූ අතර, එම ක්‍රියාවලිය අවසන් වූ පසු එයට අනුරූපී වන පරිදි පනතට අදාල සංශෝධන නිති කෙටුම්පත්කරු වෙත ඉදිරිපත් කිරීමට තීරණය වී ඇත. පනත සංශෝධනය වීමෙන් පසු මිනිසා විසින් ඇති කරනු ලබන සහ ස්වභාවිකව ඇතිවන්නා වූ ආපදා වඩා ඵලදායී අයුරින් කළමනාකරණය කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

✓ **ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධාන පනත**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට නීතිමය වශයෙන් පිළිගැනීමක් ඇතිකිරීම සඳහා 2011 වසරේ ආරම්භ කරන ලද ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සඳහා වන පනත් කෙටුම්පත මේ වන විට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් සකස් කර අවසන් කර ඇත. මෙම පනත් කෙටුම්පත නීතිපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා මේ වන විට යොමු කරනු ලැබුවද තවදුරටත් සලකා බැලීමේ දී නව සංශෝධන කිහිපයක් යෝජනා වූ අතර, එම සංශෝධන නැවත නීති කෙටුම්පත්කරු වෙත ඉදිරිපත් කල අවස්ථාවේ දී පනත් කෙටුම්පත සඳහා නව අමාත්‍යමණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමේ අවශ්‍යතාවය පෙන්වා දී ඇති බැවින් නැවත අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමු කොට ඇත.

මෙම පනත සංශෝධනය වීමෙන් අනතුරුව දැනටමත් ලාභ ලබන ආයතනයක් වන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත නිතිමය භාවයක් ලබාදීම තුලින් නායයෑම් අවදානම අවම කිරීමට අදාල පර්යේෂණ , ක්ෂේත්‍ර සමීක්ෂණ සහ අනිකුත් අදාල කටයුතු සාර්ථකව සහ කායීක්ෂමව මෙන්ම ඵලදායි අන්දමින් සම්පූර්ණ කිරීමටත්, එම ආයතනයෙන් ලබාදියහැකි තාක්ෂණික සේවය උපරිම මට්ටමින් සලසාදීමටත් හැකිවනු ඇත. එසේම ආයතනයේ මුදල් ඉපයීමේ ක්‍රය ශක්තිය වර්ධනයට ද එය ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

✓ **නීතීමය කටයුතු**

2015 වසරේ දී ආමාත්‍යාංශයට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු දෙකක් හා රිට් අයදුම්පත් එකක් විභාග වූ අතර, ඊට අමතරව ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ සේවය කරන ලද සේවයෙකු විසින් පවරන ලද නඩුවක් කම්කරු විනිශ්චය අධිකාරියේ විභාග විය. මේ අතරින් මූලික අයිතිවාසිකම් නඩු

දෙකක් සමතයකට පත්වීමෙන් පසු නිමාවට පත්විය. මෙම නීති කෘත්‍යයන් සඳහා 2015 වසරේ දී පෙනී සිටීම් 14 ක් සිදුකරන ලද අතර, වාද ගොනු කිරීම ඇතුළු අවශ්‍ය නිතිමය කටයුතු සිදුකර ඇත.

- **මහජන පැමිණිලි**

අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතනයන්හි සේවාව අපේක්ෂාවෙන් මහජනතාව විසින් ඔවුන් ගේ ගැටළු සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කරන අතර, එම පැමිණිලි ඒ ඒ ආයතන වෙත යොමු කරමින් මහජනතාවගේ ගැටළු සඳහා විසඳුම් ලබාදීමේ සම්බන්ධීකරණ කටයුතු අමාත්‍යාංශය මඟින් ඉටුකරන අතර, 2015 වර්ෂය තුළ මහජන පැමිණිලි 126 ක් ලැබී ඇත. එම පැමිණිලි අදාල ආයතන අංශ වෙත යොමු කිරීම සිදු කර ඇත.

- **ඵලදායිතා / කළමනාකරණ වැඩසටහන**

පංචවිධ සංකල්පයට අනුව කාර්යාලය පවත්වා ගැනීමේ වැදගත්කම සම්බන්ධව දේශනයක් පැවැත්වීමත් පැරණි ලිපිගොනු ලැයිස්තු ගත කොට ලේඛණාගාරයේ තැන්පත් කිරීමත් සිදුකොට ඇති අතර, මීට අදාලව දිනක වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි.

**පුහුණු වැඩසටහන්**

- **දේශීය**

අමාත්‍යාංශයේ නිලධාරින්ගේ හැකියා වර්ධනය කිරීමේ අරමුණින් දීර්ඝකාලීන පුහුණු වැඩසටහන් සඳහා 2015 වසරේ දී නිලධාරීන් දෙදෙනෙකු ද , කෙටිකාලින පුහුණු වැඩසටහන් සඳහා නොමිලේ පවත්වනු ලැබූ වැඩසටහන් සඳහා නිලධාරීන් 30 දෙනෙකු පමණ ද , මුදල් ගෙවා පවත්වන ලද කෙටිකාලීන පුහුණු පාඨමාලාවන් සඳහා නිලධාරින් 53 දෙනෙකු පමණ ද දෙමළ භාෂා පුහුණු පාඨමාලාවන් සඳහා නිලධාරීන් 20 දෙනෙකු ද පුහුණු අවස්ථා සඳහා යොමු කර ඇත.

**විදේශීය**

අමාත්‍යාංශය නියෝජනය කරමින් විදේශීය සමුළු, රැස්වීම්, සම්මන්ත්‍රණ පුහුණු වැඩමුළු 16 ක් සඳහා නිලධාරින් 11 දෙනෙකු සහභාගී වී ඇත.

- **ජාතික සුරක්ෂිත දිනය සැමරීම**

2015 වර්ෂයේ ජාතික සුරක්ෂිත දිනය සැමරීමේ සත්කාර්යය "**සුරක්ෂිත ශ්‍රී ලංකාවක්**" යන ප්‍රධාන තේමාව යටතේ සහ "**එක්වෙමු , දුරලන්න ආපදා**" යන උපතේමාව යටතේ පොළොන්නරුව දිස්ත්‍රික්කය කේන්ද්‍රකොට පැවැත්වීමට අදාළව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදි. ඒ අනුව අනුමත වූ සැමරුම් උත්සවය පැවැත්වීමට කටයුතු කරමින් පැවතුන අතර, පවතින අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් මෙම උත්සවය නොපැවැත්වීමට තීරණය කරන ලදි. එසේ වුවද මෙම සමරු උත්සවයට සමගාමීව සංවිධානය කර තිබූ ආපදා කළමනාකරණයට අදාළ සියලු වැඩසටහන් ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් ඒ අයුරින්ම ක්‍රියාත්මක කරන ලදි.

➢ **අමාත්‍ය මණ්ඩල සංදේශ හා තීරණ**

| අංකය | අමාත්‍ය මණ්ඩල සංදේශය | | ප්‍රගතිය |
|---|---|---|---|
| 1. | බත්තරමුල්ලෙහි ඉදිකරනු ලබන පුද්ගල අනන්‍යතා ලේකම් කාර්යාල ගොඩනැගිල්ල තුළ ආගමන විගමන දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම. | 2015 වසරේ මුල් මාස කිහිපය තුළ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු සම්බන්ධ වී තිබීම හේතුවෙන් අංක 1 සිට 10 දක්වා වූ අමාත්‍යමණ්ඩල සංදේශ එයට අදාලව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ වේ. | අනුමැතිය ලැබී ඇත. |
| 2. | රාජ්‍ය තාන්ත්‍රික සහ රාජකාරී විදේශ ගමන් බලපත්‍ර හිමි පුද්ගලයින් වීසා අවසර පත්‍ර ලබා ගැනීමෙන් නිදහස් කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර අත්සන් කරනු ලබන ගිවිසුම | | අමාත්‍යාංශය වෙනස්වීම මත තීරණය මෙම අමාත්‍යාංශය වෙත යොමු වී නොමැත. |
| 3. | මඩකලපුව තරුණ ක්‍රිස්තියානි සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත. | | අමාත්‍යාංශය වෙනස්වීම මත තීරණය මෙම අමාත්‍යාංශය වෙත යොමු වී නොමැත. |
| 4. | කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති බී. පී. අයි.කරුණාරත්න මහතා. | | අනුමැතිය ලැබී ඇත. |
| 5. | වීරවිල පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය සංශෝධනය කිරීම. | | අමාත්‍යාංශය වෙනස්වීම මත තීරණය මෙම අමාත්‍යාංශය වෙත යොමු වී නොමැත. |
| 6. | ඩබ්ලිව් ජෝ. පෙරේරා මහතා මහජන සාමය ආපදා කළමනාකරණ හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ උපදේශක තනතුරට පත් කිරීම. | | අමාත්‍යාංශය වෙනස්වීම මත තීරණය මෙම අමාත්‍යාංශය වෙත යොමු වී නොමැත. |
| 7. | ජීවමිතික තොරතුරු ඇතුළත් ශ්‍රී ලාංකික විදේශගමන් බලපත් නිකුත් කිරීම සඳහා ආගමන හා විගමන පනත සංශෝධනය කිරීම. | | අමාත්‍යාංශය වෙනස්වීම මත තීරණය මෙම අමාත්‍යාංශය වෙත යොමු වී නොමැත. |
| 8. | ගුවන් මගීන් පෙර ක්‍රියාවලී ගතකිරීමේ හා මගී නාම වාර්තා ලබා ගැනීමේ පද්ධතියක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීම. | | අමාත්‍යාංශය වෙනස්වීම මත තීරණය මෙම අමාත්‍යාංශය වෙත යොමු වී නොමැත. |
| 9. | යෝජිත පරිපාලන ක්‍රමවේදය සඳහා වූ සංශෝධන ද්විත්ව පුරවැසි භාවය ලබා දීම. | | අමාත්‍යාංශය වෙනස්වීම මත තීරණය මෙම අමාත්‍යාංශය වෙත යොමු වී නොමැත. |
| 10. | වීරවිල පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා වැයවන අමතර ප්‍රතිපාදන වෙන්කර ගැනීම. | | අමාත්‍යාංශය වෙනස්වීම මත තීරණය මෙම අමාත්‍යාංශය වෙත යොමු වී නොමැත. |

| | | |
|---|---|---|
| 11. | 2015 වසර සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | අනුමැතිය ලැබී ඇත. |
| 12. | 2014.10.29 වන දින කොස්ලන්ද මීරියබැද්ද ප්‍රදේශයේ නායයෑම් ව්‍යසනයෙන් අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා නිවාස ඉදිකිරීම මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල අනු කමිටු තීරණයට අදාළ වාර්තාව. (අමාත්‍ය මණ්ඩල සටහන) | අනුමැතිය ලැබී ඇත. |
| 13. | ජාතික සුරක්ෂිත දිනය සැමරීම 2015 | අනුමැතිය ලැබී ඇත. |
| 14. | 2015.04.25 දින නේපාලයේ කත්මණ්ඩු නුවර ඇති වූ භූ කම්පනයෙන් විනාශයට පත් වූ ආමික ස්ථාන 02ක් පිළිසකර කිරීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් මූල්‍යමය දායකත්වය ලබා දීම. | බුද්ධශාසන අමාත්‍යාංශයට මේ සඳහා අනුමැතිය ලබා දී ඇත. |
| 15. | ජාතික සුරක්ෂිත දිනය (අමාත්‍ය මණ්ඩල සටහන) | අනුමැතිය ලැබී ඇත. |
| 16. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2012 වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගේ නිරීක්ෂණ අනුව ගත් ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව. (සටහන) | අනුමැතිය ලැබී ඇත. |
| 17. | නිරන්තර කාලගුණ උවදුරු මගින් සිදුවන බලපෑම අවම කරනු සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනාවැකි පළකිරීමේ හැකියාව නංවාලීම. | අනුමැතිය ලැබී ඇත. |
| 18. | වෘත්තීය සමිති කටයුතු සම්බන්ධීකරණය සඳහා සහකාර ලේකම් (කම්කරු සබඳතා- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ) නොවන තනතුර සඳහා පත් කිරීම. | අනුමැතිය ලැබී ඇත. |
| 19. | ආපදා කළමනාකරණය සඳහා වූ නෛතික සහ ආයතනික රාමුව ප්‍රතිස්ථාපනය සහ සවිබල ගැන්වීම. | අනුමැතිය ලැබී ඇත. |
| 20. | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා පත් කිරීම. විශ්‍රාමික මේජර් ජනරාල් එල්. බී. ආර්. මාර්ක් මහතා | අනුමැතිය ලැබී ඇත. |
| 21. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2013 වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම. | මෙතෙක් අනුමැතිය ලැබී නොමැත |
| 22. | ජාතික සුරක්ෂිත දිනය - 2015 (අමාත්‍ය මණ්ඩල සටහන) | අනුමැතිය ලැබී ඇත. |
| 23. | අධික වර්ෂාව හේතුවෙන් සිදුවූ හානි (අමාත්‍ය මණ්ඩල සටහන) | අනුමැතිය ලැබී ඇත. |
| 24. | අමාත්‍ය කාර්යාලයේ සිට පළාත් මට්ටමින් සම්බන්ධීකරණ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා සම්බන්ධීකරණ තනතුරු 03ක් ඇති කිරීම. | අනුමැතිය සඳහා යොමු කර ඇත්තේ 2015.12.31 දිනය |
| 25. | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2012 වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම. | අනුමැතිය ලැබී ඇත. |
| 26. | ආපදා කළමනාකරණය සම්බන්ධව ශ්‍රී ලංකාව සහ පාකිස්ථානය අතර වන අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම. | අනුමැතිය ලැබී ඇත. |

මූලාය ප්‍රගතිය

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් වූ ආකාරය හා වියදම් කල ආකාරය පහත පරිදි වේ.






## 02 . සැළසුම් හා සංවර්ධන කටයුතු

- **සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය**

අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය සහ ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය විසින් දේශීය හා විදේශීය අරමුදල් භාවිතා කරමින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති සම්බන්ධීකරණය හා අධීක්ෂණ කටයුතු සංවර්ධන හා සැලසුම් අංශය මඟින් සිදුකරනු ලබයි. ඒ අනුව පහත සඳහන් කාර්යයන් ඉටුකරන ලදි.

01. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් රු.මිලියන 133 ක ඇස්තමේන්තුගත ව්‍යාපෘති යෝජනා 02 ක් ශ්‍රී ලංකා ආපදා කළමනාකරණය පිළිබඳ පුළුල් වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කරන ලදි.

02. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මඟින් නායයෑම් අවම කිරීම සඳහා වන ව්‍යාපෘති හතක් (07) අනුමැතිය සඳහා යොමුකර ඇති අතර, නායයෑම් අවධානම අවම කිරීම සම්බන්ධව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කය පදනම් කරගනිමින් විශේෂ අවධානයක් යොමු කර ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙහි ඇස්තමේන්තුගත වටිනාකම රුපියල් මිලියන 300 කි.

03. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ව්‍යාපෘති යෝජනා 23 ක් ඉදිරිපත් කර ඇති අතර, එහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය ප්‍රමාණය රු.මිලියන 4451.32 කි.

04. අමාත්‍යාංශයේ 2014 වර්ෂයට අදාල වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර 2015 මැයි මස 21 වෙනි දින පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර ඇත.

05. 2015 වර්ෂයට අදාලව සකස් කරන ලද අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතනයන්හි ප්‍රගතිය ඇතුලත් ප්‍රගති වාර්තාව සකස් කර අයවැය සාකච්ඡාව සඳහා ඉදිරිපත් කරන ලදි.

06. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිටුදැකීම සම්බන්ධයෙන් කාන්තා කටයුතු අමාත්‍යාංශය මඟින් සකස් කරන ලද ක්‍රියාකාරි සැලැස්ම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලැබිය යුතු දායකත්වය පිළිබඳව පෙන්වාදෙමින් එම ක්‍රියාකාරි සැලැස්ම සාර්ථකව සකස් කිරීමට අවශ්‍ය සහයෝගය ලබාදෙන ලදි.

07. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති/වැඩසටහන් සම්බන්ධ ප්‍රගතිය ඇතුලත් කරමින් සකස් කරන ලද කාර්තුමය වාර්තා සකස් කර ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කරන ලදි.

08. ආර්ථික කළමනාකරණය සහ ජීවන වියදම් පිළිබඳ පාර්ලිමේන්තු අනු කමිටුව වෙත අමාත්‍යාංශයට අදාල ආයතනයන් මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති යෝජනා 30 ක් යොමු කර ඇත. මෙම ව්‍යාපෘතීන් හි වටිනාකම රු.මිලියන 45,744 වන අතර, මූල්‍ය පහසුකම් සපයාගැනීම සලකා බැලීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත ද යොමු කර ඇත.

09. මීරියබැද්ද නායයෑමෙන් අවතැන් වූ ජනතාව සඳහා පූනාගල මකල්දෙනිය ප්‍රදේශයේ නිවාස 75 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කල අතර, එයින් නිවාස 45 කඉදිකිරීම් කටයුතු දෙසැම්බර් මස වන විට අවසන් අදියරේ පැවතුනි.

10. අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘතීන් හි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා වන රැස්වීම් 03 ක් ගරු විෂයභාර අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ අතර, දෙපාර්තමේන්තු නිලධාරීන් හා අමාත්‍යාංශ නිලධාරීන් ගේ ප්‍රධානත්වයෙන් රැස්වීම් 06 ක් පවත්වන ලදි. මෙමගින් ලබාදෙන ලද උපදෙස් හා අධීක්ෂණය තුළින් අමාත්‍යාංශයේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට හැකියාව ලැබුනි.

11. ව්‍යාපෘති අධීක්ෂණය යටතේ 2015 වසරේ දී මීරියබැද්ද නායයාමෙන් අවතැන් වූ පවුල් සඳහා ඉදිකරනු ලබන නව නිවාස ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකා සහ රැස්වීම් වාර 6 ක් සංවිධානය කරන ලදි.

12. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රකාශයට පත්කර ඇති පරිදි නායයෑම් සිදුවීමේ ඉහළ අවධානමක් සහිත ප්‍රදේශවල ජීවත්වන පවුල් නැවත පදිංචි කරවීම සහ නායයෑම් හේතුවෙන් විපතට පත්වූවන් සඳහා නිවාස ඉදිකිරීම කඩිනම් කිරීම සම්බන්ධයෙන් පරික්ෂා කර බැලීම සඳහා අමාත්‍යවරු 8 දෙනෙකුගෙන් යුක්තව පත් කරන ලද කමිටුවට පැවරී ඇති රාජකාරි ඉටුකිරීමට ගත් තීරණයන් සම්බන්ධව කටයුතු කිරීම සඳහා රැස්වීම් පැවැත්වීම, ආදාල කාර්යයන් කඩිනම් කිරීම සඳහා සම්බන්ධීකරණ කාර්යයන් ඉටු කිරීම හා ඒ සම්බන්ධ වාර්තාවක් සකස් කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම.

13. ආපදා කලමනාකරණ අමාත්‍යාංශයේ සහ අනුබද්ධිත ආයතන වල අදාල තොරතුරු ඇතුලත් කොට රාජ්‍ය ආයෝජන සැලැස්ම - 2016 සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු ඉටුකරන ලදි.

- **ශ්‍රී ලංකා ආපදා කළමනාකරණය පිළිබඳ පුළුල් වැඩසටහන (2014-2018)**

2013 වර්ෂයේ දී ආරම්භ කරන ලද ආපදා කළමනාකරණය පිළිබඳ පුළුල් වැඩසටහන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එහි ප්‍රධාන නිමවුම් 43 කට අදාලව වගකිවයුතු පාර්ශවකාර ආයතන 45 ක් යටතේ හඳුනාගත් ක්‍රියාකාරකම් 2014 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදි. ඒ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල මඟින් 2014 වර්ෂයේ දී වෙන්කරන ලද මුදල රුපියල් මිලියන 38.00 කි. එහි මූල්‍ය ප්‍රගතිය 100% වූ අතර අපේක්ෂිත භෞතික ප්‍රගතිය ද ළඟාකරගන්නා ලදි. 2015 වර්ෂයේ වෙන් කරන ලද මුදල රු.මි.23 ක් වූ අතර, මූල්‍ය ප්‍රගතිය 100% කි. ළඟාකරලන්නා ලද භෞතික ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

01. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් ස්වයංක්‍රීය වර්ෂාමාන පහලොවක් (15) නායයෑම් අවධානම් සහිත ප්‍රදේශයන්හි ස්ථාපිත කිරීම සිදුකර ඇති අතර, කළුතර (05), මාතර (05), හම්බන්තොට (03) සහ මොණරාගල (02) වශයෙන් මේ වන විට ස්ථාපිත කිරීම අවසන් කර ඇත. එහි මුළු වියදම රු.මි. 15 කි.

02. රත්නපුර දිස්ත්‍රික්කයේ දැනට ස්ථාපිත කර ඇති ස්වයංක්‍රීය වර්ෂාමාන 05 හි වැඩිදියුණු කිරීමේ කටයුතු මේ වන විට සිදුකෙරෙමින් පවතී. මෙහි මුළු පිරිවැය රු.මි.5 කි.

03. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය මඟින් දැනට බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි සිදුකරනු ලබන නායයෑම් අවධානම් කලාපයන්හි සමීක්ෂණ කටයුතු සිදුකිරීම සඳහා සහයෝගය දැක්වීම.

04. ශ්‍රී ලංකා ආපදා කළමනාකරණය පිළිබඳ පුළුල් වැඩසටහන යටතේ හඳුනාගෙන ඇති ප්‍රධාන පාර්ශවකාර ආයතන 11 ක් විසින් ව්‍යාපෘති වාර්තා දාහතක් (17) ඉදිරිපත් කරන ලද අතර, එම වාර්තාවන්හි තවදුරටත් සිදුවියයුතු සංශෝධනයන් සිදුකර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. ඒ අනුව ව්‍යාපෘති යෝජනා 13 ක් 2016 වසර තුළ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී ඇති අතර, එහි මුළු වටිනාකම රු. බිලියන නවයකි(09).

05. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු නිලධාරීන් 14 දෙනෙකු සඳහා දේශගුණික විපර්යාස පිළිබඳ පර්යේෂණ හා අනාවැකිකරණ ධාරිතාව වර්ධනය කිරීම සඳහා වන පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා සහාය විම සිදුකර ඇත.

06. වර්ෂාපතනය ගණනය කිරීමේ කටයුතුවල ස්වේච්ඡාවෙන් නිරතව සිටින නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට මූල්‍යමය දායකත්වය ලබාදීම.

07. සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සකස් කරන ලද රෝගියෙකු , රෝහල්ගත කර ප්‍රතිකාර ලබන තෙක් පිළිපැදිය යුතු මූලික ප්‍රතිකාර පිළිබඳ පුහුණු අත්පොත සකස් කිරීම සඳහා මූල්‍යමය දායකත්වය ලබාදීම.

08. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සකස් කරනු ලැබූ ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම සකස් කිරීමට දායක වීම.

09. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අංක 1955 දරණ ගංවතුර ආරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම.

10. ආයතනික ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීමසඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත අවශ්‍ය දායකත්වය ලබාදීම.

11. පලාත් පාලන ආයතනවල ආපදා අවධානම් අවමකරණය සම්බන්ධයෙන් එම ආයතනවල අතුරු ව්‍යවස්ථාවන්ට ඇතුලත් කිරීමට කටයුතු කිරීම සඳහා අවශ්‍ය දායකත්වය ලබාදීම සිදුකර ඇති අතර, ඒ අනුව මධ්‍යම පලාත් සභාව විසින් මේ වන විට ඔවුන්ගේ ව්‍යවස්ථාවට එම කරුණු අතුලත් කිරීමට කටයුතු කර ඇත.

12. බදුල්ල දිස්ත්‍රික්කයේ නායයෑම් අවධානම් සහිත ප්‍රදේශ සිතියම්ගත කිරීම සඳහා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය වෙත සහයෝගය ලබා දි ඇත.

13. ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානයේ ආයතනික රාමුව සංවර්ධනය කිරීම තුළින් වඩාත් කාර්යක්ෂම ආපදා සහන සේවා ක්‍රියාවලියක් ඇති කිරීමට කටයුතු කිරීම.

14. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් තාක්ෂණික නිලධාරීන් පුහුණු කිරීම සඳහා සකස් කරන ලද පුහුණු අත්පොත සම්පාදනය කිරීම සඳහා සහායවීම.

15. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධිනයට විද්‍යුත් (online) නායයෑම් තොරතුරු කළමනාකරණය සඳහා අවශ්‍ය පද්ධතියක් සකස්කිරීමට අවශ්‍ය සහයෝගය ලබාදීම.

16. පලාත් පාලන ආයතන 17 ක් සඳහා 1:5,000 ප්‍රමාණයේ පාදක සිතියම් ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සකස් කර එම සිතියම් අදාල පාර්ශවකාර ආයතන වෙත ලබාදිමට කටයුතු කිරීම.

17. ලෝක බැංකු ආධාර යටතේ ජාතික ගොඩනැඟලි පර්යේෂණ සංවිධානයට ස්වයංක්‍රීය වර්ෂාමාන 15 ක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම. මේ යටතේ රත්නපුර දිස්ත්‍රික්කය සඳහා වාර්ෂාමාන 14 ක්ද මොණරාගල දිස්ත්‍රික්කය සඳහා එක් වර්ෂාමානයක් ද ස්ථාපිත කර ඇත.

18. අමාත්‍යාංශය තුළ වෙබ්අඩවිය පාදක කරගත් (Web Based Monitoring ) ව්‍යාපෘතීන් හි ප්‍රගතිය අධීක්ෂණය හා ඇගයීමේ පද්ධතියක් සකස් කරමින් පවතින අතර, මෙමගින් ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයට අදාලව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති විධිමත් ලෙස අධීක්ෂණය හා ඇගයීමට හැකිවන පරිදි සැලසුම්කර ඇත.

19. බදුල්ල දිස්ත්‍රික් ලේකම්ගේ ඉල්ලීමක් මත බදුල්ල දිස්ත්‍රික්කයට ආපදා අවම කිරිම සඳහා ක්‍රමෝපායික සැලැස්මක් සකස් කිරීම සඳහා දායකත්වයක් ලබාදීම.

20. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ DIPECHO ව්‍යාපෘතිය සමඟ ඒකාබද්ධ වී ප්‍රාදේශීය මට්ටමේ සැලසුම් නිලධාරීනට ආපදා අවධානම් ක්‍රියාමාර්ග සංවර්ධන සැලසුම්වලට ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් ලබාදීම.

21. කාලගුණ විපර්යාසයන්ට අනුගතවීමේ ව්‍යාපෘතිය (C- Cap) ) යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩා පරිමාණයේ වාරි ජලාශ 15 ක් සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කිරිම සඳහා කටයුතු කිරීම. එම ව්‍යාපෘතිය යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ වී කුඩා පරිමාණයේ වාරි ජලාශ 16 ක රොන්මඩ ඉවත්කර අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන ලදි.



ගංවතුර ආරක්ෂණ පනත සංශෝධනය කිරීමේ වැඩමුළුව



පැල සිටුවීම හා බෙදාදීමවැඩසටහන



වැව් ප්‍රතිශංස්කරණය කිරීම (කුරුණෑගල)

## 03. ගිණුම් කටයුතු

➢ **වියදම් ඇස්තමේන්තුව - 2015**

| | අමාත්‍ය කාර්යාලය 106 – 01 - 01 | | පරිපාලන හා ආයතනික සේවා 106 – 01 – 02 | |
|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| ඇස්තමේන්තු ප්‍රතිපාදන | 35,800,000.00 | 1,200,000.00 | 77,890,000.00 | 390,820,000.00 |
| මු.රෙ 66 යටතේ මාරුකිරීම් සහ පරිපූරක ප්‍රතිපාදන | 5,060,000.00 | 350,000.00 | (540,783.00) | 540,783.00 |
| ශුද්ධ ප්‍රතිපාදන | 40,860,000.00 | 1,550,000.00 | 77,349,217.00 | 391,360,783.00 |
| වියදම | 34,691,655.00 | 1,299,244.00 | 62,824,519.00 | 59,781,686.00 |
| වියදම් ප්‍රතිශතය | 84.90% | 83.82% | 81.22% | 15.27% |

➢ **වියදම් සඳහා මූල්‍යකරණය**

| සංකේතය | වියදම් මූල්‍යකරණය | ශුද්ධ ප්‍රතිපාදන | සත්‍ය වියදම | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 11 | දේශීය අරමුදල් | 260,900,000.00 | 116,177,705.00 | 44.52% |
| 12 | විදේශීය ආධාර ණය | 1,000,000.00 | - | - |
| 13 | විදේශීය ආධාර ප්‍රධාන | 249,220,000.00 | 42,419,399.00 | 17.02% |

➢ **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**

| | වියදමෙහි උපරිම සීමාව | ලැබීමේ අවම සීමාව | උපරිම හර ශේෂ සීමාව |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාව | 7,000,000.00 | 2,500,000.00 | 16,000.000.00 |
| 2015.12.31 දිනට සත්‍ය අගය | 6,798,291.28 | 5,084,493.78 | 12,514,651.00 |

- **2015.12.31 දිනට ණය / අත්තිකාරම්**

| ණය වර්ගය | ණය ප්‍රමාණය (රුපියල්) | ණය ලබාගත් සංඛ්‍යාව |
|---|---|---|
| උත්සව අත්තිකාරම් | 2,005,000.00 | 201 |
| විශේෂ අත්තිකාරම් | 124,000.00 | 31 |
| ආපදා ණය | 4,621,933.00 | 42 |

- **ප්‍රසම්පාදන කටයුතු**

| ප්‍රාග්ධන | අමාත්‍ය කාර්යාලය | | අමාත්‍යාංශ කාර්යාලය | |
|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම |
| 2102 ගෘහභාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 500,000.00 | 443,237.00 | 1,115,000.00 | 1,114,304.00 |
| 2103 - යන්ත්‍රෝපකරණ | 850,000.00 | 794,693.00 | 885,000.00 | 865,651.00 |
| මුළු එකතුව | 1,350,000.00 | 1,237,930.00 | 2,000,000.00 | 1,979,955.00 |
| මූල්‍යමය ප්‍රගතිය | 92% | | 99% | |
| ප්‍රාග්ධන | අමාත්‍ය කාර්යාලය | | අමාත්‍යාංශ කාර්යාලය | |
| | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම |
| 1201 - ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 1,110,00.00 | 1,104,407.00 | 1,600,000.00 | 1,594,572.00 |
| මුළු එකතුව | 1,110,00.00 | 1,104,407.00 | 1,600,000.00 | 1,594,572.00 |
| මූල්‍යමය ප්‍රගතිය | 99% | | 100% | |

- 2015 විසර්ජන ගිණුම සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් “බී“ ගිණුම 2015.12.31 දිනට සකස් කර මේ වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.

- පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව හා විගණන රැස්වීම් වාර්තා මඟින් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

## 05 . අභ්‍යන්තර විගණන කටයුතු

2015 වර්ෂයට අදාලව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සම්බන්ධයෙන් විගණන පරික්ෂණ තුනක් (03) සිදුකර ඇති අතර, විශේෂ විමර්ශන එකක් (01) සිදුකර ඇත. අදාල විමර්ශන සිදුකරන ලද ක්ෂේත්‍රයන් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

01. 2015 වර්ෂයට අදාල ප්‍රාරම්භක වාර්තාව
02. 2015 වර්ෂයට අදාළ දෙවන හා තෙවන කාර්තු සඳහා වූ වාර්තාව
03. ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානයේ 2014 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව හා භාණ්ඩ වට්ටෝරු ලේඛණය පරික්ෂාව.
04. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් ලද අභියාචනා සම්බන්ධයෙන් විශේෂ විමර්ශනයක් සිදුකරන ලදි.

මීට අමතරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් (03) ක් පවත්වා ඇත. ලැබී ඇති විගණන විමසුම් ගණන පනස් පහක් (55) වන අතර, එකී විගණන විමසුම් පනස්පහ (55) සඳහාම පිළිතුරු සපයා ඇත. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත විගණන විමසුම් 11 ක් යොමු කර තිබූ අතර, එම සියළුම විගණන විමසුම් සඳහා මෙම වර්ෂය තුලදීම පිළිතුරු සපයා ඇත.

# 11 කොටස

# ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය

## හැඳින්වීම

ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (වර්තමාන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය) 1996 වර්ෂයේදී සමාජ සේවා සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද අතර සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිණිස අංක 1422/22 හා 2005.12.08 දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ආපදා සහන සේවා අමාත්‍යාංශය යටතට පත් විය.

2007.01.09 දින අංක 1482/9 දරන ගැසට් නිවේදනය මගින් එය ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය යනුවෙන් නම් කොට නැවත පදිංචි කිරීමේ හා ආපදා සහන සේවා අමාත්‍යාංශය වෙත පවරන ලදී.

අංක 1651/220 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව 2010.04.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. ආපදා කළමනාකරණ ආමාත්‍යංශය යටතේ එම විෂයභාර අමාත්‍යවරයා සහ අමාත්‍යාංශ ලේකම් විසින් දෙනු ලබන ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශකත්වයට අනුව ක්‍රියාත්මක වෙමින් පවතී. ජාතික ආපදා සහන සේවා මධ්යස්ථානයේ සියලුම ව්‍යාපෘති හා වැඩසටහන් රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණයට අනුකූලව යමින් අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්‍ෂණය යටතේ ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම මෙම කටයුතු සම්බන්ධීකරණය කරමින් කාර්යක්‍ෂමව ඉටු කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්ට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට සංවර්ධන සහකාර (ආපදා කළමනාකරණ), සංවර්ධන නිලධාරී (ආපදා සහනසේවා) ලෙස උපාධිධාරීන් අනුයුක්ත කර ඇත.

## දැක්ම

ප්‍රශස්ථ පසු ආපදා සහන සේවාවන් තුළින් වඩාත් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් කරා යාම.

## මෙහෙවර

ස්වභාවික හා මිනිසා විසින් ඇති කරනු ලබන ආපදාවන්ගෙන් සිදුවන අනර්ථකාරී බලපෑම්වලට ප්‍රතිචාර දැක්වීම හා යථාවත් කිරීම මගින් මිනිස් ජීවිත, දේපළ හා ජන ජීවිතය සුරැකීම.

## අරමුණ

සමාජයට පරිසරයට හා ආර්ථිකයට ආපදා වලින් ඇති කරන අහිතකර බලපෑම් අවම කිරීම සහ ආපදා සහන සඳහා ජාතික ධාරිතාවන් ශක්තිමත් කිරීම තුළින් තිරසාර සංවර්ධනය කිරීමේ ජාතික අරමුණට දායක වීම.

**ඉලක්ක සහ ක්‍රියාකාරකම්**

- ✓ පසු ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම.
- ✓ තොරතුරු සන්නිවේදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
- ✓ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ✓ යහ පාලනය ඇතිකිරීම

**පසු ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම**

- ❖ කාර්යක්ෂම ආපදා සහන සේවාවක් තුලින් සුදුසු ප්‍රතිලාභියා වෙත කඩිනම් සහන ලබාදීම.
- ❖ ආපදා හේතුවෙන් හානියට ලක්වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීම හා ආපදාවන්ට ඔරොත්තු දෙන නිවාස ඉදිකිරීම
- ❖ වගාහානි, ස්වයං රැකියා හානි හා ග්‍රාමීය සුළු පරිමාණ යටිතල පහසුකම් සිදුකිරීම
- ❖ පසු ආපදා කළමානාකරණ ක්‍රියාවලීන් පිළිබඳව ආපදා සහන සේවා නිලධාරීන් බලමුළු ගැන්වීම

**තොරතුරු සන්නිවේදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම**

- ❖ අන්තර්ජාල තොරතුරු පද්ධතිය මගින් ආපදා සිදු වී කෙටි කාලයක් තුළ තොරතුරු ලබා ගැනීම
- ❖ තොරතුරු සන්නිවේදන ජාලය ශක්තිමත් කිරීම

**ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

- ❖ ආපදා හේතුවෙන් සිදුවන හානිය අවම කරගැනීම සඳහා ග්‍රාමීය මට්ටමින් ඇතිකරනු ලබන ආපදා සහන සේවා කමිටු බලමුළු ගැන්වීම.
